# ටෙන්ඩර් දැන්වීමයි

## ඇඹිලිපිටිය නගර සභාව - 2013 වර්ෂයට දේපල බදු දීම

ඇඹිලිපිටිය නගර සභාවට අයත් පහත උපලේඛනයේ සඳහන් දේපල 2013.01.01 දින සිට 2013.12.31 දින දක්වා කාලසීමාවකට බදු දීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් 2012.10.25 දින සිට 2012.11.07 දින ප.ව.3.00 දක්වා මවිසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර් අයදුම්පත් ලබාගැනීමේදී අයදුම්කරුවන් ස්වකීය අනන්‍යතාව තහවුරු කළ යුතු අතර, ප්‍රවර්ධන බදු කරුවන් වෙත ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ ඔවුන් විසින් ගෙවිය යුතු නියමිත බදු මුදල් හිඟ නොමැතිව ගෙවා නියමිත අයුරින් බදු ගිවිසුම්වලට එළඹ ඇත්නම් පමණි. බදු මුදල් හිඟ හිටුවා ඇති බදුකරුවන්ට ටෙන්ඩර්පත් නිකුත් කරනු නොලැබේ.

**ඉල්ලුම්කරුවන් සඳහා කොන්දේසි**

01. 2012.11.06 දින ප.ව.3.00 දක්වා මෙම කාර්යාලයට නියමිත ගාස්තු ගෙවා ටෙන්ඩර් පෝරම ලබාගත හැකිය. මෙකී ගාස්තු මුදලින් විය යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

02. සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. එක් එක් පිටපත්, මුල් පිටපත් අනුපිටපත් යනුවෙන් කවර දෙකක වෙන වෙනම බහා අනතුරුව දෙකම එක කවරයක බහා එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙලවරේ උප ලේඛනයේ පරිදි අදාල දේපල සඳහන් කළ යුතුයි. එසේ නොඑවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. බදුකරු විසින් ඉල්ලුම් කරනු ලබන මුදල වාරික 12 කින් ගෙවිය යුතු අතර වාරික 03ක මුදලක් සභාවේ තැන්පත් කර ගිවිසුම් පත්‍රයට අත්සන් කළ යුතුය. එසේ තැන්පත් කරන මුදල ආපසු ගෙවනු ලබන්නේ නියමිත වාරික ගණන ගෙවා නිම කිරීමෙන් පසුවය.

04. බදුකරු විසින් ඉල්ලුම් කරනු ලබන මුදලට රජය විසින් නියම කරන බදු මුදල් ද එකතු කර ගෙවිය යුතුය. අමුණා ඇති උප ලේඛනයේ අවම ලංසුව දක්වා ඇත්තේ ද එම බදු මුදල් රහිතවය. එසේ තෝරාගන්නා ලද බදුකරු තැන්පත් කරනු ලබන වාරික 03 ක මුදල් සඳහාද රජය විසින් නියම කරන බදු මුදල් ගෙවිය යුතුය.

05. මීට අමතරව රජය විසින් හෝ නගර සභා ආඥා පනතේ විධි විධානවලට අනුකූලව විටින් විට පනවනු ලබන බදු මුදල් ගෙවීමටද, බදු මුදල් සංශෝධන කිරීම්වලටද බදුකරු එකඟ විය යුතුය.

06. ටෙන්ඩර්පත්‍ර තැපෑලෙන් එවනු ලබන්නේනම් නියමිත වේලාවට ප්‍රථම ලැබෙන පරිදි, " සභාපති, ඇඹිලිපිටිය නගර සභාව" යන ලිපිනයට ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුය. එසේ නොමැති නම් 2012.11.07 දින පෙ.ව.10.00 ට පෙර මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුයි. එකී වේලාවට ප්‍රමාදව ලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ටෙන්ඩර් තැන්පත් මුදල්ද ආපසු ගෙවනු නොලැබේ.

07. 2012.11.07 දින පෙ.ව.10.15 ට මෙම කාර්යාලයේදී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ.

08. අවම ලංසුවට අඩුවෙන් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත් සහ නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද ටෙන්ඩර්පත් අවලංගු කරන අතර ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු නොලැබේ.

09. සියළුම ගෙවීම් මුදලින් විය යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

10. ටෙන්ඩර්කරු සමග එළඹෙන ගිවිසුම අනුව 2013 ජනවාරි මස 10 දින සිට සෑම මාසයකම 10 දින හෝ ඊට පෙර මුදල් පහත සඳහන් පරිදි ගෙවිය යුතුය.

    (අ), නවනගර සතිපොළ, වැසිකිළි පද්ධතිය, පල්ලේගම බස්නැවතුම්පල හා ඇඹිලිපිටිය නගරය තුළ රථවාහන නවතා තැබීමේ ගාස්තු සඳහා වාරික මුදල අතපසුවන සෑම සතියකටම හෝ ඉන් කොටසකටම වාරික මුදලෙන් 10% (සියයට දහයක) ප්‍රමාද ගාස්තු සමඟ ද,

    (ආ) පල්ලෙගම අංක 01 මාළු කඩය හා 02 මාළු කඩය කුකුල් මස් කඩය යන කඩකාමර සඳහා වාරික මුදල් ප්‍රමාදවන සෑම දිනයක් සඳහාම රු.5.00 ක ප්‍රමාද ගාස්තුවක් සමගද වාරික මුදල් ගෙවිය යුතුය.

11. ටෙන්ඩර් පෝරම ලබාගෙන නියමිත වෙලාවට ප්‍රථම ටෙන්ඩර් ඉදිරිපත් නොකරන අයගේ හා ටෙන්ඩර් පිළිගෙන ගිවිසුම් අත්සන් කළ යුතු කාලය ඇතුලත ගිවිසුම් අත්සන් නොකරන අයගේ ටෙන්ඩර් ඇප ආපසු ගෙවනු නොලැබේ.

12. ටෙන්ඩර් පත්‍රයක් වෙනස් කිරීමක් හෝ මකා දැමීමක් සිදු කරන්නේ නම් ටෙන්ඩර්කරු එය මත කෙටි අත්සන යොදා තිබිය යුතුය.

13. මෙම දැන්වීමට අදාල ටෙන්ඩරයක් හෝ සියළු ටෙන්ඩර් හේතු නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ බලය ඇඹිලිපිටිය නගර සභාව සතුවන අතර, මේ සම්බන්ධයෙන් සභාපති විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

14. සතිපොළ සඳහා බදු අයකිරීමේදී සභාව මගින් ලබාදෙනු ලබන මිල දර්ශනය අනුව බදු අයකළ යුතු බවත්, එසේ නොකරන අයගේ ගිවිසුම අවලංගු කරන බවත් දැනගත යුතුය.

15. සතිපොළ පැවැත්වීමෙන් පසු ටෙන්ඩර්කරු තමාගේ වියදමින් එය විධිමත්ව පිරිසිදු කළ යුතුය. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී මේ පිළිබඳව සැලකිල්ලට ගත යුතුය.

16. 2013 වර්ෂයේ ජනවාරි සිට සතිපොළ නවනගරයේ ආර්ථික මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන අතර සභාව සතු සතිපොළ භූමියේ සංවර්ධන කටයුතු අවසන් වූ වහාම එම ස්ථානයේ සතිපොළ ස්ථානගත කරන බැවින් එකී දිනය දක්වා මෙම ටෙන්ඩරය වලංගු වන බවත් දැනගත යුතුයි.

17. බස්නැවතුම්පල වැසිකිළි පද්ධතිය බදු ගන්නා අය විසින් වැසිකිළි පාවිච්චි කරනු ලබන එක් එක් පුද්ගලයාගෙන් රු .5.00 බැගින් අය කර ගැනීමට අවසර දෙනු ලැබේ. බස්නැවතුම්පල වැසිකිළි පද්ධතිය පිරිසිදු කිරිම ටෙන්ඩර්කරු විසින්ම සිදු කලයුතු අතර, වැසිකිළිය වෙනුවෙන් ගෙවිය යුතු ජල ගාස්තු. විදුලි ගාස්තු ,ගලිබවුසරයේ ගාස්තු ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය.

18. වැසිකිළි පද්ධති බදු ගන්නා අය විසින් වැසිකිළි පාවිච්චි කරනු ලබන එක් එක් පුද්ගලයාගෙන් රු.5.00 බැගින් අය කර ගැනීමට අවසර දෙනු ලැබේ.

19. වැසිකිළි පිරිසිදු කිරිම ටෙන්ඩර්කරු විසින්ම සිදු කලයුතු අතර, වැසිකිළි වෙනුවෙන් ගෙවිය යුතු ජල ගාස්තු. විදුලි ගාස්තු ,ගලිබවුසරයේ ගාස්තු ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය.

20. රථ වාහන වලින් බදු අය කිරීමේදී පහත සඳහන් මුදල් අය කල යුතුය.

20.1.බස්රථයක් හෝ ලොරි රථයක් සඳහා පළමු පැය 03 සඳහා රු.30 ක් හා අමතර පැයකට රු. 5 බැගින්

20.2 මෝටර් කාරයක් සඳහා පළමු පැය 03 සඳහා රු.20.00 ක් ද, අමතර පැයක් සඳහා රු.5.00 බැගින්ද

20.3 වෙනත් වාහන සඳහා (ත්‍රීවිල් හැර) රු.5.00 පළමු පැය 03 සඳහා රු.5.00 ක් සහ අමතර පැයකට රු. 1.00 බැගින්ද

21. පල්ලේගම බස්නැවතුම්පළේ නවතා තබනු ලබන බස්රථයකට එක් වාරයකට රු.20.00 බැගින් මුදල් අයකළ යුතුය.

22. මෙයට අදාල සියළුම විස්තර කාර්යාල වේලාවන් තුළදී ඇඹිලිපිටිය නගර සභාවේ ලේකම්ගෙන් විමසා දැනගත හැකිය.

## උපලේඛනය

| අනු අංකය | ස්ථානය | ටෙන්ඩර් ආකෘතිපත්‍ර ගාස්තුව | ටෙන්ඩර් ඇප මුදල රු. ශත | 2013 අවම ලංසුව (බදු රහිතව) |
|---|---|---|---|---|
| 1. | පල්ලේගම අංක 01 මාළු කඩය | 500.00 | 2700.00 | 53966.00 |
| 2. | පල්ලේගම අංක 02 මාළු කඩය | 500.00 | 4290.00 | 85800.00 |
| 3. | පල්ලේගම කුකුල් මස් කඩය | 500.00 | 1980.00 | 39600.00 |
| 4. | පල්ලේගම බස්නැවතුම්පල වැසිකිළි පද්ධතිය | 500.00 | 54915.00 | 1098300.00 |
| 5. | පල්ලේගම බස්නැවතුම්පල ගාස්තු අයකිරීම | 500.00 | 50000.00 | 1000000.00 |
| 6. | ඇඹිලිපිටිය නගරය තුළ රථවාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම | 500.00 | 6905.00 | 138096.00 |
| 7. | නවනගර සතිපොළ | 500.00 | 100000.00 | 2000000.00 |

2012.10.25 දින

ඇඹිලිපිටිය නගර සභා කාර්යාලයේදී

දු.අං.047-2230275

පූජ්‍ය වේවැල්දූවේ ඥානප්‍රභ හිමි,

සභාපති,

ඇඹිලිපිටිය නගර සභාව.